# ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සංස්ථාපනයට අදාල

## නිර්ණායක හඳුනා ගැනීම

## පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

### පළාත් පාලන ආයතන සංස්ථාපනය සඳහා නිර්ණායක තීරණය කිරීම පිණිස පත් කරන ලද කමිටුව වෙත ඊට අදාලව යෝජනා කැඳවීම.

නව පළාත් පාලන ආයතන සංස්ථාපනය සහ පවත්නා පළාත් පාලන ආයතන, නගර සභා හා මහා නගර සභා ලෙස උසස් කිරීම සඳහා නිර්ණායක තීරණය කිරීම පිණිස ගරු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තපා මැතිතුමා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ චන්දක ජයසුන්දර මහතාගේ සභාපතිත්වයෙන් යුත් විද්වත් කමිටුවක් පත් කරනු ලැබ ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම හා පවත්නා පළාත් පාලන ආයතනයන්හි තත්ත්වය ඉහළ නැංවීම සඳහා උපයෝගී කොට ගත හැකි ජාතික නිර්ණායක පද්ධතියක් නොමැත. මේ හේතුකොටගෙන ශ්‍රී ලංකාවේ නාගරික ලක්ෂණ විද්‍යාමාන වන, සාපේක්ෂ වශයෙන් දියුණු ප්‍රදේශ පවා ඊට අනුරූපිත පළාත් පාලන ආයතන ලෙස නොපැවතීම බොහෝවිට දක්නට ලැබේ. එසේම ප්‍රමුඛ ග්‍රාමීය ස්වරූපයේ ප්‍රදේශ පවා නාගරික පළාත් පාලන ආයතන තුලට ඇතුලත්ව තිබෙනු දැකිය හැකිය.

**එබැවින් මෙම තත්වය මගහැරවීම පිණිස යථාරූපී, වර්ධිත ප්‍රදේශ නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශ ලෙස නිශ්චිතව හඳුනා ගැනීම සඳහා පිළිගත හැකි ජාතික නිර්ණායක පද්ධතියක් ගොඩනැගීම යථෝක්ත කමිටුවේ කාර්යය වනු ඇත.**

එබැවින් උක්ත කමිටුව එහිලා ශ්‍රී ලංකාවේ මෙම විෂය පිළිබඳ ප්‍රමාණික දැනුමක් සහිත වෘත්තිකයන්ගෙන් හෝ වෘත්තීය සංවිධානවලින්, මහජනතාවගෙන් හා මහජන සංවිධානවලින් මෙහිලා උපයෝගී කොට ගත හැකි අදහස් හා යෝජනා ලබා ගැනීමට අදහස් කොට ඇත.

මෙම කමිටුව සිය කටයුතු මාස 03ක් තුල අවසන් කොට අදාල වාර්තාව ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින් මෙම විෂයට අදාලව ඔබගේ, ඔබ සංවිධානයේ වටිනා අදහස්, යෝජනා හෝ නිර්දේශ කමිටුවේ ලේකම් වෙත ලැබීම පිණිස 2016 අගෝස්තු මස 15 දිනට ප්‍රථම තැපෑලෙන්, විද්‍යුත් තැපෑලෙන් හෝ ෆැක්ස් මගින් එවන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමු.

**කමිටු ලේකම්,**
**පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,**
**අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02**

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා කාර්යාල වේලාවන් තුල අමාත්‍යාංශයේ නීති අංශය අමතන්න.

දුරකතන අංකය : 0112302720
ෆැක්ස් : 0112337161
විද්‍යුත් තැපැල් ලිපිනය : legal@pclg.gov.lk